# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

### සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාට හා එක් වීම පිණිස පහත සඳහන් පුරප්පාඩු පිරවීම අරභයා, සුදුසුකම්ලත් කාර්යශූර, ස්වයං, උද්යෝගී, වෘත්තිය උන්නතිකාමී, කණ්ඩායම් හැඟීමෙන් යුත් අය අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවෙකුම**

(i) ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.

(ii) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරට පැවරෙන රාජකාරි මැනවින් ඉටුකිරීමට සමත්, ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) අනර්ඝ හා විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.

**01. ගබඩා භාරකරු තනතුර (MA-2-1-III ශ්‍රේණිය)**

**සුදුසුකම් :** බාහිර අපේක්ෂකයින්

(අ) **අධ්‍යාපනික**

(i) අපොස (සා/පෙළ) විභාගයේදී එකම වතාවකදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) කින් සමත් වීම

සහ

(ii) අපොස (උ/පෙ) විභාගයේදී (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් 02 කින් සමත්ව සිටීම. (නව නිර්දේශය)

හෝ

අපොස (උ/පෙ) විභාගයේදී (පැරණි නිර්දේශය) විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් දෙකකින් (02) සමත් වීම

සහ

(iii) පරිගණක සාක්ෂරතාව

සහ

(ආ) රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් එක් (01) වසරක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

සහ

(ඇ) **වෘත්තියමය**

NVQ (ජාතික වෘත්තීය කුසලතා) - 5 මට්ටමට නොඅඩු, මිලදී ගැනීම් හෝ තොග ලේඛන කළමනාකරණ ඩිප්ලෝමාව

**සුදුසුකම් :** අභ්‍යන්තර අපේක්ෂකයින් :

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (SPMC) හි ප්‍රාථමික මට්ටම - නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු යන ප්‍රවර්ගවල සේවකයෙකු වීම හා අපොස (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) කින් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සමත්වීම හා වෘත්තීය සුදුසුකම් සමග අදාළ පළපුරුද්ද ලබා ගැනීමට යටත්ව ස්ථිර තනතුරක වසර පහක (05) සතුටුදායක අඛණ්ඩ සේවය.

**වැටුප් :** MA 2-1-2016 රු. 30,310/- - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 - 50,940/-

**වයස :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන්ට බල නොපානු ඇත.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරගකාරී විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**02. ඖෂධ නිමා කිරීමේ සහායක තනතුර : (PL 2 - III ශ්‍රේණිය)**

**සුදුසුකම් :** බාහිර අපේක්ෂකයින්

(අ) අපොස (සා/පෙ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ හතරක් (04) ක් සමග ඉංග්‍රීසි භාෂාව ඇතුළුව, විෂයයන් හයකින් (06) කින් සමත් වීම

සහ

(ආ) ඖෂධ ඇසුරුම්කරණය පිළිබඳව එක් වසරක පුහුණුව (NVQ - ජාතික වෘත්තීය කුසලතා 2 හෝ 3 මට්ටමට සමාන)

**සුදුසුකම් :** අභ්‍යන්තර අපේක්ෂකයින්

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන (නීතිගත) සංස්ථාවේ (SPMC) හි, ප්‍රාථමික මට්ටම - නුපුහුණු හි සේවකයෙකු වීම සමග ඉහත සඳහන් අධ්‍යාපනික / වෘත්තීයමය සුදුසුකම් සමග ස්ථිර තනතුරක වසර පහක (05) ක සතුටුදායක අඛණ්ඩ සේවය.

**වැටුප පරිමාණය :** PL - 2 - 2016 රු. 25,750/- - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - 38,950/-

**වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

මෙම ඉහළ (උපරිම) වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් හට බලනොපානු ඇත.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**03. වැඩ සහයක (කම්කරු) තනතුර (PL-1-III ශ්‍රේණිය)**

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

අපොස (සා/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 02 (දෙක) කින් සමත්වීම.

**වැටුප් පරිමාණය :** PL -1-2016 රු. 24,750/- - 10 x 250 - 10 x 270 - 7 x 300 - 15 x 330 - 37,000/-

**වයස :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**ආන්තික ප්‍රතිලාභ :**

- පැමිණීමේ හා කාර්ය සාධන දිරි දීමනා
- උපයෝගී කර නොගත් වාර්ෂික හා අසනීප නිවාඩු ප්‍රතිපූරණය
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සහ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණ යෝජනා ක්‍රමය
- සංස්ථාව විසින් වැටුපෙන් 15% ක්ද, සේවකයා / සේවාලාභියා 10% ක්ද වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකත්වය.
- සංස්ථාව විසින් වැටුපෙන් 3% ක් සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට (ETF) දායකත්වය

**පොදු උපදෙස් :**

- නියමිත ආකෘති පත්‍රය භාවිතා කරමින් සකසන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින හා විමසුම් විස්තරද සමග ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපනික සහතික පත්‍ර වල සහතික කළ පිටපත් අයදුම්පත් සමග අමුණා ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත්‍රයේ ආකෘති පත්‍ර රාජ්‍ය ඖෂධ නිෂ්පාදන (නීතිගත) සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://www.spmclanka.lk වෙතින් බාගත කළ හැකිය.
- රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින්ගේ අයදුම්පත් අදාළ ස්වකීය ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුවන අතර, එම ප්‍රධානීන් විසින් අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය එම පත්වීම භාර ගැනීම සඳහා මුදා හැරිය හැකිද යන වග සහතික කර තිබිය යුතුය.
- අයදුම්කරන තනතුර, අයදුම්පත් බහා ඉදිරිපත් කරන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව ලියා මෙම දැන්වීමේ දින සිට දින 07 ක් ඇතුළත පහත සඳහන් ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එම අයදුම්පත් එවිය යුතුය.
- ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන (නීතිගත) සංස්ථාව,**
**අංක 11, සර් ජෝන් කොතලාවල මාවත,**
**කඳවල වත්ත, රත්මලාන.**

Source: Dinamina, Daily News (2020.02.20), Application: www.spmclanka.lk (2020.02.21)